සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	කාලය நேரம் Time
6 ශ්‍රේණිය	පැය 02යි

විද්‍යාව I -II

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

I කොටස

* වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පරිසරයේ ඇති දෑ බෙදෙන ප්‍රධාන කාණ්ඩ දෙක මොනවා ද?
(1) ජලය සහ පස (2) ශාක සහ සතුන් (3) ජීවීන් හා අජීවීන් (4) මිනිසුන් සහ ගොඩනැගිලි

02. ද්‍රව්‍යයකට ස්ථිර හැඩයක් සහ ස්ථිර පරිමාවක් ඇත්තේ කුමන අවස්ථාවේ ද?
(1) ද්‍රව (2) වායු (3) ඝන (4) වාෂ්ප

03. මිරිදිය ජලයෙන් වැඩිම ප්‍රමාණයක් අඩංගු වන්නේ කුමන ආකාරයෙන් ද?
(1) ගංගා සහ විල්වල ජලය ලෙස (2) භූගත ජලය ලෙස
(3) ධ්‍රැව ප්‍රදේශවල අයිස් තට්ටු ලෙස (4) වායුගෝලයේ වාෂ්ප ලෙස

04. ජල චක්‍රය පවත්වාගෙන යන්නේ ප්‍රධාන වශයෙන් කුමන ශක්ති ප්‍රභවය මගින් ද?
(1) සුළඟ (2) විදුලි බලය (3) භූ තාපය (4) සූර්යයා




05. පෙනීම සඳහා අත්‍යවශ්‍ය සාධක දෙක කුමක් ද?
(1) ඇස සහ වර්ණ (2) මොළය සහ රූපය (3) ඇස සහ ආලෝකය (4) ආලෝකය සහ වර්ණ

06. ජීවී විශේෂයක අඛණ්ඩ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන ජීවී ලක්ෂණය කුමක් ද?
(1) චලනය (2) පෝෂණය (3) වර්ධනය (4) ප්‍රජනනය

07. නිවසේ ශක්ති පරිභෝජනය අඩු කර ගැනීමට ගත හැකි එක් ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) පැරණි විදුලි බුබුලු භාවිතා කිරීම. (2) සෑම කාර්යයකට ම විදුලි උපකරණ භාවිතා කිරීම.
(3) විදුලිය පිරිමසින උපකරණ භාවිතා කිරීම. (4) දහවල් කාලයේ දී විදුලි බුබුළු භාවිතා කිරීම.

08. හුස්ම පිට කිරීමේදී වාතයේ කාබන්ඩයොක්සයිඩ් තිබෙන බව තහවුරු කිරීමට යොදාගත් පරීක්ෂණයේදී, හුණු දියරවලට සිදුවන්නේ කුමක් ද?
(1) එය පැහැදිලි වීම. (2) එය නිල් පැහැයට හැරීම. (3) එය කිරි පැහැයට හැරීම. (4) එය වාෂ්ප වී යාම.

09. පුයරවල ඇති සිනිඳු බව නිසා ඒවා ඝර්ෂණය අඩු කිරීමට කැරම් ක්‍රීඩාවේදී භාවිතා වේ. පුයරවල පවතින අතට දැනෙන මෙම භෞතික ගුණය කුමක් ද?
(1) භංගුරතාව (2) තන්‍යතාව (3) ප්‍රත්‍යස්ථ බව (4) වයනය

10. මිනුම් සරාව භාවිතා කර ද්‍රවයක පරිමාව මැනීමේදී, වඩාත් නිවැරදි මිනුමක් ලබා ගැනීම නිවැරදිව දක්වා ඇත්තේ,
(1)  (2)  (3)  (4) 


11. චුම්බක සම්බන්ධ ප්‍රකාශ අතුරින් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) තඹ, ඇලුමිනියම්වලින් තැනූ වස්තු චුම්බකවලට ආකර්ශණය නොවේ.
(2) චුම්බකයක් සෑමවිටම උතුරු-දකුණු දිශාව ඔස්සේ පිහිටයි.
(3) සජාතීය චුම්බක ධ්‍රැව අතර ආකර්ශණ බලයක් ඇති වේ.
(4) පෙති චුම්බකවල ධ්‍රැව පිහිටන්නේ දෙකෙලවර නොව දෙපැත්තෙහි ය.

12. සුළං ධාරාවක් මගින් විදුලිය නිපදවන විදුලි බලාගාරය පිහිටා ඇත්තේ,
(1) නොරොච්චෝලයෙහි ය. (2) රන්දෙනිගල ය. (3) කොත්මලේ ය. (4) පුත්තලමෙහි ය.

13. නිදහසේ චලනය විය හැකි චුම්බකයක හැසිරීම ප්‍රයෝජනයට ගෙන නිපදවා ඇති උපකරණ හා එහි කාර්යය නිවැරදි දක්වා ඇති පිළිතුර කුමක් ද?
(1) පීඩනමානය - වායු පීඩනය මැනීම. (2) මාලිමාව - දිශාව සොයා ගැනීම.
(3) උෂ්ණත්වමානය - උෂ්ණත්වය මැනීම. (4) ආර්ද්‍රතාමානය - ආර්ද්‍රතාව මැනීම.

Past Papers Wiki

14. සරල විද්‍යුත් පරිපථයක රූප සටහනක් පහත දැක්වේ. A,B,C පිළිවෙලින් දක්වා ඇත්තේ,



(1) ස්විච්චිය, බල්බය, වියළි කෝෂය
(2) බල්බය, වියළි කෝෂය, ස්විච්චිය
(3) වියළි කෝෂය, ස්විච්චිය, බල්බය
(4) වියළි කෝෂය, බල්බය, ස්විච්චිය


15. පරිසර උෂ්ණත්වය අනුව දේහ උෂ්ණත්වය වෙනස් නොවන සත්ත්වයෙකු වන්නේ,
(1) කටුස්සා ය. (2) ගෙම්බා ය. (3) මිනිසා ය. (4) සමනලයා ය.

16. (වායු → ද්‍රව) යන අවස්ථා විපර්යාසයට වඩාත්ම ගැලපෙන පිළිතුර කුමක්ද ?
(1) අයිස් කැට සෑදීම. (2) යකඩ ද්‍රව වීම. (3) තුෂාර ඇති වීම. (4) ඉටි ද්‍රව වීම.

17. තාපය ලැබීම නිසා ද්‍රව්‍ය ප්‍රසාරණය වේ. ප්‍රසාරණය ප්‍රයෝජනයට යොදාගන්නා අවස්ථාවක් **නොවන්නේ,**
(1) කරත්ත රෝදයකට පට්ටමක් සවි කිරීම.
(2) වීදුරු බෝතලයක කටට සවි වූ ගැලවීමට අපහසු ලෝහ මූඩියක් ගැලවීම.
(3) උෂ්ණත්වමානයකින් උෂ්ණත්වය මැනීම.
(4) ඊයම් යොදාගෙන යකඩ පෑස්සීම.

18. ආහාර දාම සම්බන්ධ **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) ආහාර දාමයක පළමු පුරුක සෑම විටම හරිත ශාකයක් වේ.
(2) ආහාර දාමයක දෙවන පුරුක සෑමවිටම සර්ව භක්ෂකයෙක් වේ.
(3) නිෂ්පාදකයා තුළ ගබඩා වූ ශක්තිය, ආහාර දාමයේ යැපෙන්නන්ට ලැබේ.
(4) ආහාර දාමයක දෙවන යැපෙන්නා ශාක භක්ෂකයෙක් නොවේ.

19. කාලගුණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට විවිධ උපකරණ නිර්මාණය කරනු ලැබේ. පහත දැක්වෙන උපකරණය හා එමගින් මනිනු ලබන සාධකය කුමක් ද?




(1) සරල ආර්ද්‍රතාමානය - ආර්ද්‍රතාවය
(2) අනිලමානය - සුළඟේ වේගය
(3) වර්ෂාමානය - වර්ෂාපතනය
(4) අනිලමානය - සුළඟේ දිශාව

20. ස්වාභාවික ආපදාවලින් සිදු වන අනතුරු අවම කර ගැනීම සඳහා,
(1) පරිසර හිතකාමී ලෙස ක්‍රියා කළ යුතුය.
(2) ආපදා පිළිබඳ ව ජනමාධ්‍ය මගින් ලබාදෙන උපදෙස් පිළිපැදිය යුතුය.
(3) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන නිවේදනවලට අනුව ක්‍රියාකළ යුතුය.
(4) ඉහත සඳහන් සියල්ල ම කළ යුතුය.

II කොටස

* **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01.(A) ''ආහාර හා බැඳුණු අන්තර් ක්‍රියා'' පාඩමට අදාලව පරිසරය නිරීක්ෂණය කර, විද්‍යා ගුරුතුමාගේ උපදෙස් මත අන්තර්ජාලයෙන් ලබා ගත් ඡායාරූප ශිෂ්‍යයෙකු විසින් ඉදිරිපත් කරන ලදි.



(මෙම රූප සටහන් ඇසුරෙන් පිළිතුරු ලියන්න)

(i) මෙම රූප සටහන් ඇසුරෙන් පුරුක් 04 කින් යුත් ආහාර දාමයක් ලියන්න.


(ii) එම ආහාර දාමයේ නිෂ්පාදකයා හා දෙවන යැපෙන්නා නම් කරන්න.

(iii) මෙහි දැක්වෙන සතුන් අතුරින් ශාක භක්ෂක, මාංශ භක්ෂක හා සර්ව භක්ෂක සතෙකු බැගින් තෝරා ලියන්න.

(iv) පරිසරයේ ජීවත්වන උකුස්සන් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වුවහොත් පසුකාලීනව බළලුන්ගේ සංඛ්‍යාව ද ක්‍රමයෙන් අඩු වේ. මෙය පැහැදිලි කරන්න.

Past Papers Wiki

(B) ගෙවත්තේ බෝගවලට හානිකරන සතුන් පලවා හැරීම සඳහා සකස් කරන ලද උපකරණයක් පහත දැක්වේ.



(i) මෙම උපකරණය කුමක් ද?


(ii) මෙම උපකරණය සෑදීමට යොදාගත් A හා B ද්‍රව්‍ය 02 ලියන්න.

(iii) මෙම උපකරණය නාද කිරීමට කුමක් කළ යුතු ද?

(iv) පරිසරයේ ඇසෙන ස්වාභාවිකව හා කෘත්‍රිමව ඇති වන ශබ්දයක් බැගින් ලියන්න.

(v) ශ්‍රවණය සඳහා සංවේදීවන ඉන්ද්‍රිය නම් කරන්න.

02.(A) ජීවීන් සිය ආහාර අවශ්‍යතා සපුරා ගන්නා ආකාරය මත පෝෂණ ආකාර දෙකකි.





(i) රූප මඟින් පෙන්වා ඇති A හා B පෝෂණ ආකාර දෙක හඳුනාගෙන නම් කරන්න.

(ii) A හි දැක්වෙන පෝෂණ ආකාරයට අවශ්‍ය ශක්ති ප්‍රභවය කුමක් ද?

(iii) A හි දැක්වෙන ක්‍රියාවලිය කුමක් ද?

(iv) සතුන්ට පමණක් සුවිශේෂී වෙනත් ජීවී ලක්ෂණයක් ලියන්න.

(B) පරිසර සුන්දරත්වය සඳහා ජීවී විවිධත්වය වැදගත් වේ.

(i) මත්ස්‍යා, ගිරවා යන සතුන් දෙදෙනාගේ සංචරන ක්‍රම හා උපාංග ලියන්න.


(ii) ජීවත් වන පරිසරයට අනුව පහත සඳහන් ශාක වර්ග කර දක්වන්න.

වැලිස්නේරියා, කිරල, අඹ, වැටකෙයියා

පරිසරය	ශාක
ජලජ	
භෞමික	

පරිසරය	ශාක
වෙරළබඩ	
කඩොලාන	

03.(A) විවිධ ද්‍රව තුළින් ආලෝකය ගමන් කරන ආකාරය නිරීක්ෂණය කිරීම සඳහා කරනු ලබන ක්‍රියාකාරකමක් පහත දැක්වේ.



මෙහි දී එක් එක් අවස්ථාවේ දී බෝතලයට පිරිසිදු ජලය, දැවුණු එන්ජින් ඔයිල් හා මඩ ජලය පුරවා පරීක්ෂණය සිදු කෙරේ.

(i) පාරභාසක **සහ** ද්‍රව්‍ය දෙකක් ලියන්න.

(ii) පහත වගුවේ හිස්තැන් පුරවන්න.

ද්‍රවය	නිරීක්ෂණය වන ආකාරය	මාධ්‍යය වර්ග කිරීම
පිරිසිදු ජලය	ඉටිපන්දම හා ආලෝකය හොඳින් පෙනේ	(a).....
බොර ජලය	(b).....	පාරභාසක
දැවුණු එන්ජින් ඔයිල්	(c).....	(d).....


(B) එදිනෙදා ජීවිතයේ දී ශක්තිය විවිධ කාර්යයන් කිරීමට අවශ්‍ය වේ.

(i) ශක්ති ප්‍රභවයක් යනු කුමක් ද?

(ii) ශ්‍රී ලංකාවේ විදුලිය නිපදවීමට වර්තමානයේ යොදාගෙන ඇති ශක්ති ප්‍රභව තුනක් නම් කරන්න.

(iii) ශක්ති ප්‍රභවවල තිරසාර භාවිතයට අදාල උදාහරණයක් ලියන්න.

04.(A) ලවණතාවය එකිනෙකට වෙනස් ජල බඳුන් තුනක් රූපයේ දැක්වේ.



(i) රූප සටහනේ A, B, C අතුරින් මිරිදිය ජලය අඩංගු බඳුන කුමක් ද?


(ii) ලුණු නිශ්පාදන සඳහා යොදා ගත හැක්කේ කුමන බඳුනේ අඩංගු ජලය ද?

(iii) ලවණතාව පදනම් කරගෙන ජලය බෙදෙන කොටස් තුන නම් කරන්න.

(B) ජීවීන් වර්ග කිරීම සඳහා විවිධ ක්‍රම උපයෝගී කර ගනී.


(i) බාහිර ලක්ෂණයක් පදනම් කරගෙන එම ලක්ෂණය පැවතීම හෝ නොපැවතීම අනුව ජීවීන් වර්ග කිරීම හඳුන්වන නම කුමක් ද?

(ii) පහත දක්වා ඇති A, B, C, D, E පත්‍ර ඔබ සඳහන් කළ ඉහත ක්‍රමයට වර්ග කර දක්වන්න.



A B C D E

05.(A) සැහැල්ලු දණ්ඩ චුම්බකයකට, කඩදාසිවලින් කපාගත් පියාපත් අලවා අලංකාර සමනලයෙක් නිර්මාණය කර නූලකින් එල්ලා ඇති ආකාරය රූපයේ දැක්වේ.



(i) පහත දී ඇති ද්‍රව්‍යවලින් චුම්බක සමනලයාට ආකර්ශණය වන ද්‍රව්‍ය තෝරා ලියන්න.

- තඹ කාසිය
- යකඩ ඇණය
- වානේ තහඩුව
- ඇලුමිනියම් කම්බිය

(ii) සමනලයා ඉදිරියට හා පිටුපසට චලනය කිරීමට ඔබට තවත් දණ්ඩ චුම්බකයක් සපයා ඇත.

සමනලයාව ඉදිරියට හා පිටුපසට චලනය කිරීමට දණ්ඩ චුම්බකයක් සමනලයාගේ **ඉදිරියෙන්** තැබිය යුතු ආකාරය අඳින්න.

a - ඉදිරියට b - පිටුපසට

(iii) චුම්බක සමනලයා, ඉදිරිපිට හා පිටුපසට චලනය වීමට උපකාරී වූ බලය (ආකර්ෂණය/ විකර්ෂණය) තෝරා ලියන්න. a - ඉදිරියට b - පිටුපසට

(iv) චුම්බක භාවිත කරන අවස්ථා 02 ක් ලියන්න.

(B) කම්බි දඟරයක් තුළ චුම්බකයක් චලනය කර විදුලිය නිපදවා ගත හැකි බව ශිෂ්‍යයෙක් පවසයි.

(i) ශිෂ්‍යයාගේ ප්‍රකාශයෙහි සත්‍ය බව පළමුවරට පරීක්ෂණාත්මකව තහවුරු කළ විද්‍යාඥයා නම් කරන්න.

(ii) ඉහත ප්‍රකාශයෙහි සඳහන් ආකාරයට විදුලිය නිපදවා ගත හැකි විද්‍යුත් ප්‍රභවයක් නම් කරන්න.

(iii) ලංකාවේ තාප විදුලි බලාගාරයක් පිහිටි ස්ථානයක් නම් කරන්න.

(iv) විදුලිය සංරක්ෂණය සඳහා පාසලේ ශිෂ්‍යයෙකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ගයක් ලියන්න.

06.(A) තාපය නිසා සිදු වන අවස්ථා විපර්යාස නිරීක්ෂනය සඳහා සිදු කළ ක්‍රියාකාරකමක් පහත රූපයේ දැක්වේ.



(i) (a) ලෝහ බටයේ නිදහස් කෙළවරට දැල් වූ ගිනිකුරක් ලං කළ විට කුමක් නිරීක්ෂණය වේද?

(b) ඉහත නිරීක්ෂණයට හේතු වන්නේ කුමන අවස්ථාවේ පවතින ඉටි ද?

(ii) ඉටි පන්දමක් දැල්වෙන විට සිදු වන අවස්ථා විපර්යාසක් ලියන්න.

(iii) තාපය නිසා ඇති වන පාරිසරික බලපෑම් දෙකක් ලියන්න.

(B) සිසුන් කණ්ඩායමක් විසින් ව්‍යාපෘතියක් සඳහා ප්‍රධාන නගර කීපයක ලබාගත් කාලගුණික තොරතුරු වගුවක් පහත දැක්වේ.

දිනය	උපරිම උෂ්ණත්වය හා ස්ථානය	අවම උෂ්ණත්වය හා ස්ථානය	උපරිම වර්ෂාපතනය හා ස්ථානය
2024.10.20	36.4 ^{0}C පොළොන්නරුව	12.3 ^{0}C නුවරඑළිය	9.2 mm කලුතර
2024.10.21	37.1 ^{0}C පොළොන්නරුව	13.5 ^{0}C නුවරඑළිය	7.5 mm හිනිදුම
2024.10.22	36.1 ^{0}C පොළොන්නරුව	12.8 ^{0}C නුවරඑළිය	3.8 mm නැබොඩ

(i) මෙම වගුව අනුව උපරිම උෂ්ණත්වය වාර්තාවන ස්ථානය හා එම උෂ්ණත්වය කොපමණ ද?

(ii) නගරවල උෂ්ණත්වය මැනීමට භාවිත වන උපකරණය හා ඒකකය කුමක් ද?

(iii) ඉහත නගරවල වර්ෂාපතනය මැනීමට භාවිත වන උපකරණය හා ඒකකය කුමක් ද?

(iv) කාලගුණය කෙරෙහි බලපාන වෙනත් සාධකයක් ලියන්න.

(v) වර්ෂාපතය අවම වීම නිසා ඇති විය හැකි ස්වාභාවික ආපදාව කුමක් ද?

PAST PAPERS WIKI
www.PastPapers.Wiki

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank